WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

පත්‍රය	ලකුණු
I	

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

පරීක්ෂක 1		
පරීක්ෂක 2		
EMF		

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

භූගෝල විද්‍යාව I

විභාග අංකය: .....

උපදෙස්:

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
- ✳ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

1. ප්‍රධාන වශයෙන් ..... සමග උෂ්ණත්වය වෙනස්වීමේ ස්වභාවය පදනම් කරගෙන වායුගෝලය ස්තර හතරකට බෙදා දැක්වේ.
(උන්නතාංශය / පීඩනය / ආර්ද්‍රතාව)

2. විවිධ පාෂණ ද්‍රව්‍ය අධික තාපයට හා පීඩනයට හසුවීම නිසා ඒවායේ මුල් ස්වභාවය වෙනස්වීමෙන් ..... පාෂාණ නිර්මාණය වේ.
(ආග්නේය / අවසාදිත / විපරීත)

3. ශ්‍රී ලංකාවේ සිලිකා වැලි බනිජය බහුලව ව්‍යාප්ත වී ඇත්තේ ..... ප්‍රදේශයෙහි ය.
(මාරවිල / පුල්මුඩේ / බලංගොඩ)

4. කළුතර, කෑගල්ල හා ..... යන දිස්ත්‍රික්කවල ප්‍රධාන ව්‍යාපාරික බෝග වගාව වන්නේ රබර් ය.
(රත්නපුර / කුරුණෑගල / බදුල්ල)

5. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි වැඩි ම ප්‍රතිශතයක් හිමිවන්නේ ..... ජනතාවට ය.
(ග්‍රාමීය / නාගරික / වතු)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

6. 'හවායි' දූපත් නිර්මාණය වී ඇත්තේ යමහල් ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. **නි / වැ**

7. 'සහරා' 'අරාබි' සහ 'ථාර්' යන කාන්තාර ප්‍රදේශ නිවර්තන දේශගුණ කලාපය තුළ පිහිටා ඇත. **නි / වැ**

8. මාතර, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවල ව්‍යාප්තව ඇති තේ වගාව 'මැදරට' තේ වගාව ලෙස හැඳින්වේ. **නි / වැ**

9. ශ්‍රී ලංකාවේ කිරි ලබා ගැනීම සඳහා ඇතිකරනු ලබන මී ගවයන්ගෙන් 2/3 ක් ම ඇති කරනු ලබන්නේ වියළි කලාපීය ප්‍රදේශවල ය. **නි / වැ**

10. බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ හටගන්නා සුළි සුළං 'හරිකේන්' නමින් හඳුන්වනු ලැබේ. **නි / වැ**

● අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පස තුළ අන්තර්ගතව ඇති ජලය ..... ලෙස හැඳින්වේ.

12. ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විතවන මහාද්වීපික කබොල සිලිකා හා ඇළුමිනියම්වලින් යුක්තවන හෙයින් ..... ස්තරය ලෙස හැඳින්වේ.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

13. ඇළහැර හා ඔක්කම්පිටිය ..... ඛනිජය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.


14. ලෝකයේ මහාද්වීපවල ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව මුළු ජන සංඛ්‍යාවෙන් 76% ක්ම වාසය කරන්නේ ආසියාව සහ ..... යන මහාද්වීප දෙකෙහි ය.

15. ශ්‍රී ලංකාවේ ශෘණ කර්මාන්තවල ස්ථානගතවීම අනුව පිළිමතලාව ප්‍රදේශය වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ ..... කර්මාන්තයට ය.

16. සියලුම වනාන්තර වර්ග අතුරින් ඉහළ ම ජෛව විවිධත්වයක් දක්නට ඇත්තේ ..... වනාන්තරවල ය.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

ශ්‍රී ලංකාවේ කිරි ආශ්‍රිත වෙළඳපොළ ප්‍රවණතා 2005-2019



17. ඉහත ප්‍රස්තාරය අනුව වාර්ෂික මුළු කිරි පරිභෝජනය උපරිම අගයක් ගන්නේ.....වර්ෂයේ දී ය.

18. වාර්ෂික මුළු කිරි නිෂ්පාදන ප්‍රමාණය හා ආනයන අතර වැඩිම පරතරයක් දක්නට ඇත්තේ ..... වර්ෂයේ දී ය.

19. මුළු කිරි පරිභෝජනයේ උච්චාවචනයන් කෙරෙහි වැඩි බලපෑමක් සිදුව ඇත්තේ නිෂ්පාදනය හා ආනයන අතුරෙන් කුමකින් ද? .....

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති නිත් ඉර මත ලියා දක්වන්න.**

WWW.OLEVELAPI.COM

20.

'අ'	'ආ'
බෝගය	**පර්යේෂණායතනය පිහිටා ඇති ස්ථානය**
1. වී	A - මාතලේ
2. තේ	B - ලබුකැලේ
3. සුළු අපනයන බෝග	C - බෝඹුවල
	D - තලවාකැලේ

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, A (.....)

21.

'අ'	'ආ'
විදුලි බලාගාරය	**විදුලි ප්‍රභවය**
1. කැනියොන්	A - තාප විදුලිය
2. නොරච්චෝලේ	B - සුළං බලය
3. බරුතකන්ද	C - සූර්ය ශක්තිය
	D - ජල විදුලිය

(1) A, B, C (2) B, C, D (3) C, B, D (4) D, A, C (.....)

/තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

22.

'අ' සංචාරක ආකර්ෂණය	'ආ' වැදගත් ස්ථාන
1. දියමත ලිස්සායාම	A - ආරුගම්බේ
2. සමුද්‍ර අභය භූමිය (කොරල්)	B - හික්කඩුව
3. පුළුල් වැලිතලාවලට මායිම් වූ නොගැඹුරු මුහුදු	C - පාසිකුඩා
	D - මන්නාරම

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) C, D, A (.....)

23.

'අ' රට	'ආ' මිලියන නගරය
1. ඇමෙරිකා එක්සත් ජනපදය	A - සාඕ පොලෝ
2. දකුණු කොරියාව	B - ලොස් ඇන්ජලීස්
3. ආර්ජන්ටිනාව	C - සෝල්
	D - බුවනෝස් අයර්ස්

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (.....)

24.

'අ' ගිනි කන්ද	'ආ' පිහිටි රට
1. ක්‍රැකටෝවා	A - ඉතාලිය
2. හෙක්ලා	B - ඉන්දුනීසියාව
3. පිනාටුබෝ	C - අයිස්ලන්තය
	D - පිලිපීන් දූපත්

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (.....)

● අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය. ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25. 'පැනමා' ඇළෙන් සම්බන්ධවන සාගර දෙක වන්නේ,
(1) අත්ලන්තික් සහ පැසිෆික් ය. (2) පැසිෆික් සහ ඉන්දියන් ය.
(3) ඉන්දියන් සහ අත්ලන්තික් ය. (4) පැසිෆික් සහ ආක්ටික් ය. (.....)

26. ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති වරණය තෝරන්න.
(1) ගෝලීය උණුසුම - හිම වැස්ම දියවීම (2) වනාහරණය - කාන්තාරකරණය
(3) වර්ෂාපතනය - නායයෑම (4) උන්නතාංශය - උෂ්ණත්වය (.....)

27. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග හා සම්බන්ධ **නොගැලපෙන** පිළිතුර කුමක් ද?
(1) මල් වර්ග - නුවරඑළිය (2) කරාබු නැටි - මහනුවර
(3) කජු - මන්නාරම (4) ගම්මිරිස් - මොණරාගල (.....)

28. වර්තමානයේ විශාල නෞකා බහුල වශයෙන් භාවිත වන්නේ කුමන කාර්යයක් සඳහා ද?
(1) භාණ්ඩ ප්‍රවාහනයට (2) මගී ප්‍රවාහනයට
(3) යුද කටයුතුවලට (4) ධීවර කටයුතුවලට (.....)

29. ලෝහමය **නොවන** ඛනිජයකි,
(1) මැණික්. (2) ඉල්මනයිට්. (3) රූටයිල්. (4) මැග්නීසියම්. (.....)

30. ශ්‍රී ලංකාවේ භූගත ජල ද්‍රෝණි බහුලව ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක යුගලය කුමක් ද?
(1) මන්නාරම හා මුලතිව් (2) අනුරාධපුර හා කුරුණෑගල
(3) පුත්තලම හා කිලිනොච්චි (4) ත්‍රිකුණාමලය හා වව්නියාව (.....)

31. ලෝකයේ තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගන්නා රටවල් දෙක ඇතුළත් වරණය තෝරන්න.
(1) චීනය හා කැනඩාව (2) ඉන්දියාව හා රුසියාව
(3) ඕස්ට්‍රේලියාව හා කැනඩාව (4) චීනය හා ඉන්දියාව (.....)

32. කඳුකර වියළි කලාපීය වනාන්තර දක්නට ලැබෙන ප්‍රදේශයක් වන්නේ මින් කුමක් ද?
(1) කන්නෙලිය (2) සමනල කන්ද (3) සඳතැන්න (4) පිදුරුතලාගල (.....)

/හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

33. මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව පෙළගැස්වූ විට නගරවල පිහිටීමේ නිවැරදි ආරෝහණ අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ත්‍රිකුණාමලය, මහනුවර, නුවරඑළිය, හැටන්
(2) ත්‍රිකුණාමලය, මහනුවර, හැටන්, නුවරඑළිය
(3) මහනුවර, හැටන්, නුවරඑළිය, නාවලපිටිය
(4) මහනුවර, නුවරඑළිය, හැටන්, ගම්පොළ (.....)

34. පහත ප්‍රකාශ සලකන්න.
A - පරිසර දූෂණය අවම වීම
B - මූලික පිරිවැය අවම වීම
C - ක්ෂය නොවන සම්පතක් වීම
D - දේශීය තාක්ෂණය භාවිත කළ හැකිවීම
ඉහත A සිට D දක්වා ඇති කරුණු අතුරෙන් ශ්‍රී ලංකාවේ සුළං බල ශක්ති හා සූර්ය බල ශක්ති උත්පාදනය හා භාවිතය සම්බන්ධ පොදු වාසිදායක කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A හා B (2) A හා C (3) A හා D (4) C හා D (.....)

35. ලෝක ජන ව්‍යාප්තිය අනුව අධික ජන සංඛ්‍යාවක් වාසය කරන ගංගා නිම්නයක් වන්නේ,
(1) කොන්ගෝ ය. (2) මරේ ඩාලිං ය.
(3) ගංගානම් ය. (4) ඇමේසන් ය. (.....)

36. භූ විද්‍යාත්මක උපද්‍රවයකට නිදසුනකි,
(1) සුනාමි. (2) සුළි සුළං.
(3) අකුණු සැර. (4) ළැව් ගිනි. (.....)

37. ශ්‍රී ලංකාවේ ආපදා අනතුරු අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි වඩාත් ප්‍රතිඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ,
(1) ජනමාධ්‍ය මගින් නිරතුරුව දැනුම්වත් කිරීම ය.
(2) ආපදා අවම කර ගැනීමේ මෙවලම් හඳුන්වා දීම ය.
(3) ආපදාවලට ඔරොත්තු දිය හැකි නූතන ඉදිකිරීම් ක්‍රම හඳුන්වා දීම ය.
(4) පාසල් අධ්‍යාපනය තුළින් ආපදා ආරක්ෂණ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම ය. (.....)

● පහත **A**, **B**, **C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල භොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. වන සංරක්ෂණය
2. ජල පෝෂක ප්‍රදේශ

B - 1. කාර්මීකරණය
2. පාරිසරික සමතුලිතතාව

C - 1. සංවර්ධන ක්‍රියාවලිය
2. මානව සම්පත

D - 1. ප්‍රාග්ධන හිඟය
2. බහු ජාතික සමාගම්

38. පළමුවැන්නේ සාර්ථකත්වය දෙවැන්නේ පැවැත්මට හිතකර වන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (.....)

39. දෙවැන්නේ පැවැත්මට පළමුවැන්න බාධාවක් වන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (.....)

40. පළමුවැන්නේ සාර්ථකත්වයට දෙවැන්නේ දියුණුව බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (.....)

* *

/පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...